# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 869 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 22/05/2024 පැය 1830

## මාධ්‍ය නිවේදනය

### “සුවසාර කැදල්ල” ප්‍රජාපාදක පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන වැඩසටහන පළමු අදියරෙහි නිමාව

මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් ඉන් මුදවා ගනිමින් ඔවුන් සඳහා සුරක්ෂිත අනාගතයක් නිර්මාණය කිරීම සඳහා “සුවසාර කැදල්ල” ප්‍රජාපාදක පුනරුත්ථාපන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන 11 ක් පිහිටුවන ලදි. ඉන් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් 500 දෙනෙකුට ආසන්න පිරිසක් සඳහා 2024.05.08 වන දින සිට 2024.05.21 වන දින දක්වා අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය සහ මෙහෙයවීමෙන්, ශ්‍රී ලංකා පොලිසියේ කොට්ඨාස රැසක නිලධාරීන් විසින් තම දායකත්වය සපයමින් සිදු කරන ලද මෙම වැඩසටහනේ පුනරුත්ථාපනලාභීන් 500 කට ආසන්න පිරිසක් සමාජගත කිරීම 2024.05.22 වන අද දින උදෑසන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල සංකීර්ණයේ 04 වන මහලේ පිහිටි සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

මෙම අවස්ථාවට සහභාගී වූ අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතා විසින් සුවසාර කැදැල්ල වැඩසටහන සම්බන්ධව අදහස් දක්වන ලද අතර, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති දයා සමරවීර මහතා විසින්ද මෙම අවස්ථාවේදී අදහස් ප්‍රකාශ කරන ලදි. උත්සව අවස්ථාව විචිත්‍රවත් කරමින් පුනරුත්ථාපනලාභින් විසින් සෞන්දර්යාත්මක අංගයන් ඉදිරිපත් කරන ලදි.

පොලිස්පතිතුමා උත්සව සභාව අමතා "පොලිසියේ මෙහෙයවීමෙන් දිවයිනේ මත්ද්‍රව්‍ය තුරන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවත්, තවදුරටත් සුවසාර කැදැල්ල ව්‍යාපෘතිය යටතේ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන් ඉන් මුදවා ගෙන නිසි පරිදි සමාජගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවටත්" පවසා සිටින ලදි.

උත්සව අවස්ථාව සඳහා අන්තරායක ඖෂධ පාලක මණ්ඩලයේ ලේකම්, බස්නාහිර පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඒ.පී.එම්. ගුණරත්න මහතා සහ කොළඹ දිසාව භාර

නියෝජ්‍ය පොලිස්පති ඒ.ජී.ජේ. චන්ද්‍රකුමාර මහතා ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ උසස් නිලධාරීන් රැසක් සහභාගී විය.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**